**පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත - 2015**

පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ඌව, නැගෙනහිර හා උතුරු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් ප්‍රතිග්‍රාහක ඌව, නැගෙනහිර හා උතුරු පළාත්වල සමාජ, ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ - ඌව පළාතේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,592 කට සමාන එජඩො මිලියන 67.2 ක් වන අතර, ඉන් රු.මිලියන 6,800 කට සමාන එජඩො මිලියන 60 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින නිම කර තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම

පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ). ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ). ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ). විශේෂ (ඩොලර්) ගිණුම් ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ). ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ). 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ). ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

එකතුව රු. 251,216 ක් වූ උපයන විට ගෙවීම් බදු ව්‍යාපෘතියේ නිලධාරින් 8 දෙනෙකුගෙන් අයකරගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ, වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් 2015 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 60.0 | 6,800 | 1,109 | 2.62 | 348.93 | 54.34 | 6,762.25 |
| ශ්‍රීලංර | 7.2 | 792 | 203 | - | 121.33 | - | 827.28 |
| එකතුව | 67.2 | 7,592 | 1,312 | 2.62 | 470.26 | 54.34 | 7,589.53 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට වෙන් කරන ලද එජඩො මිලියන 60 ක් වූ මුළු වෙන් කිරීම් අතුරින් සියයට 90.6 ක් නියෝජනය වන එජඩො මිලියන 54.34 ක් පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයට උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ආරම්භක වැඩ සැලැස්ම අනුව, ඌව පළාතේ කිලෝමීටර 150ක් වූ පළාත් මාර්ග 6 ක් පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, පසුව පුනරුත්ථාපනය කාර්යයන්හි විෂය පථය කිලෝමීටර් 121.77 ක් දක්වා අඩු කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, සියලු මාර්ග පුනරුත්ථාපන කටයුතු හා ව්‍යාපෘතිය විසින් පැකේජ 94 යටතේ පිරිනමන ලද මාර්ග නඩත්තු කොන්ත්‍රාත් 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. තවද 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද පළාත් මාර්ග 04 ක බස්මගී ආවරණ 54 ක් තැනීමට රු.මිලියන 10.36 ක අමතර ප්‍රතිපාදනයක් කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට එම කාර්යයන්ද නිම කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග පුනරුත්ථාපන කාර්යයන් සඳහා අවිධිමත් ක්‍රම යොදා ගැනීම නිසා, ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද පළාත් මාර්ග 6ක් අතුරින් ගලඋඩ - කන්දකැටිය - කරමැටිය මාර්ගයේ හා හග්ගල මැග්ඩොනල්ඩ් මාර්ගයේ ස්ථාන කිහිපයකම මාර්ග තලයේ හා කාණු පද්ධතියේ අඩුපාඩු, විගණකවරුන් විසින් කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) එකක් රු. 257,250 ක් වූ පිරිවැයකට පළාත් මාර්ග 04 ක බස්මගී ආවරණ 54 ක් ඉදිකිරීමට 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. පිරිවිතරයන්ගෙන් බැහැර වූ ඉදිකිරීම් හා බස්මගී ආවරණ 22 ක පොළව මතුපිට ඉරිතැලීම් වැනි අඩුපාඩු 2016 මාර්තු 21 දින විගණකවරුන් විසින් සිදු කරන ලද වැඩබිම් පරික්ෂාවේදී අනාවරණය විය.

## 3.4 නොවිසඳී ඇති පෙර විගණන වාර්තාවල පෙන්වා ඇති කරුණු

උපදේශකයින් සමඟ එළඹී ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය විසින් උපදේශක කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු අතර ඒ අනුව මෝටර් රථ 15ක් යෙදවීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් මෝටර් රථ 25ක් සපයා තිබූ අතර ඒ අනුව රු.මිලියන 50.5 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා ඒ අනුව හේතුන් විමර්ශනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3. 5 මතභේදයට තුඩු දෙන කරුණු

මාර්ග පුනරුත්ථාපන කාර්යයන්හි ශක්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් ලංසුකරුගෙන් තොරතුරු කැඳවීමකින් තොරව ගලඋඩ - කන්දකැටිය - කරමැටිය මාර්ගයේ මාර්ග පුනරුත්ථාපන කටයුතු ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 32 ක් අඩු පිරිවැයක් වූ රු. මිලියන 767.33 ක පිරිවැයකට විදේශීය බද්ධ ව්‍යාපාරයක් සහිත කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. බද්ධ ව්‍යාපාර ගිවිසුම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර නොමැති බවද තව දුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, මිල ඉහළ යාම් හා කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා සිටින ලද දින 736 ක කාලය දීර්ඝ කිරීම් සම්බන්ධයෙන් ව්‍යාපෘතිය සමඟ හටගත් මතභේද විසඳ ගැනීම සඳහා රු.මිලියන 729 ක් ඉල්ලා කොන්ත්‍රාත්කරු විසින් ආරාවුල විසඳීමේ නඩුවක් ගොනු කර තිබුණි. ඉල්ලා සිටින ලද මුළු මුදලින්, රු.මිලියන 32.8 ක් ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් ආරාවුල විසඳීමට විනිශ්චය සභාව වෙත අභියාචනයක් කර තිබූ අතර 2015 අගෝස්තු 06 දින විනිශ්චය සභාව දෙන ලද තීරණය අනුව තවත් රු. මිලියන 471.61 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට ව්‍යාපෘතියට නියම කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින නීති උපදෙස් ලබා ගැනිමට ව්‍යාපෘතිය කටයුතු කර තිබූ අතර වාණිජ මහාධිකරණය වෙත නඩුව යොමු කිරීමේ අවස්ථා සඳහා උත්සාහ ගෙන තිබුණි.

## 3.6 ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන අනුව, ඌව පළාත තුළ මගී ප්‍රවාහන පද්ධතියේ මට්ටම ඉහල නැංවීම සඳහා ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග වල ගමන් කාලය අඩු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද මාර්ග පුනරුත්ථාපනයට පෙර හා පසු ගමන් කාලය ඇගයීම් කර පළාත් සභාවේ විෂය සීමාව යටතේ ඇති මගී සේවා බස්රථ වල කාලසටහන් සංශෝධනය කිරීමට ඌව පළාත් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ කාර්යයන් නිම කර තිබුණද, වත්කම් අදාළ පාර්ශව වෙත භාර දීමට හා 2015 දෙසැම්බර් 31 දිනට ඇවර කිරීමේ ගිණුම් පිළියෙළ කිරීමට ව්‍යාපෘතිය හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.